# ශ්‍රී ලංකාවේ වැඩිහිටි අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ විධිවිධාන හා ඒවායේ ක්‍රියාකාරීත්වය

දුෂ්මන්ති ලියනගේ[7]

## සංක්ෂේපය

ශ්‍රී ලංකාව වූ කලී බහු වාර්ගික, බහු ආගමික මෙන්ම බහු සංස්කෘතික රටක් වේ. ඒ අනුව 2014 ජන හා සංඛ්‍යා ලේඛන වාර්තා වලට අනුව ශ්‍රී ලංකාවේ ජනගහනය 20,359,439ක් වන අතර මෙකී වාර්තාවට අනුව ජන සංයුතිය පිළිබඳව සැලකීමේදී ශ්‍රී ලංකාවේ ජීවත් වන වැඩිම පිරිසක් සිංහල ජාතිය වන අතර එය සියයට 74 ක් වන අතර සෙසු ජාතීන් ලෙස දෙමළ සියයට 18 ක් වූ අතර මුස්ලිම් සියයට 7ක් හා බර්ගර් සියයට 1ක් පමණ වේ (ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2014 වාර්තාව). 21 වන සියවසේ දී ලෝකය තුළ දක්නට ලැබෙන ප්‍රධාන ජන සංඛ්‍යා උපනතියක් බවට පත් වී ඇත්තේ, වයස්ගත ජන සංඛ්‍යාව ඉහළ යාමයි. සාමාන්‍යයෙන් මහලු ජනගහනයක් ලෙස රටක් හඳුන්වනු ලබන්නේ අවුරුදු 60 ඉක්ම වූ ජන සංඛ්‍යාවෙන් සියයට 8ක් හෝ සියයට 10ක් ඉක්ම වූ විට එරට "වයස් ගත වූ ජන සංඛ්‍යාවක් සහිත රටක් " ලෙස අර්ථ දක්වනු ලබයි (සමාජ සේවා හා සමාජ සුබ සාධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, 2006: 6). ශ්‍රී ලංකාවේ සමස්ත ජන සංඛ්‍යාවෙන් සියයට 12.4ක් වැඩිහිටි ජනගහනය වන බැව් එම වාර්තා තුළින් තව දුරටත් පෙන්නුම් කෙරේ. මෙලෙසින් ක්‍රම ක්‍රමයෙන් වැඩි වන වැඩිහිටි ජනතාව කෙරෙහි සමාජයේ පවතින ආකල්ප සහ නොසැලකිල්ල හේතුවෙන් ලෝකයේ බොහෝ රටවල වැඩිහිටි අයිතිවාසිකම් කඩ වන අවස්ථාවන් දක්නට ලැබෙන හෙයින් එයට විසඳුමක් ලෙස බොහෝ රාජ්‍යයන් විසින් විවිධ රාජ්‍ය යාන්ත්‍රන පද්ධති ගොඩ නගා තිබෙනු දක්නට ලැබේ. නමුත් මෙම ක්‍රියා මාර්ග ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නැංවීමේ දුර්වලතා සමාජය තුළින් බොහෝ අවස්ථාවලදී දක්නට ලැබේ. මහින්දාගමනයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට බුදු දහමින් සුපෝෂිත වූ ආචාර ධර්ම උරුම විය. ඒ අනුව දෙමාපිය, ගුරුවරු, වැඩිහිටි සබඳතා තව දුරටත් අගය කරන බෞද්ධ සංස්කෘතික සමාජ දිවි පෙවතක් ගොඩනැගුනි. මේ අනුව ශ්‍රී ලංකාවේ ජීවත් වන වැඩිහිටි ජනතාව යනු අත්දැකීම් බහුල වූ සමාජ කොටසක් පමණක් නොවන අතර ඔවුන් ලාංකීය සමාජය තුළ අයිතිවාසිකම් හිමි තවත් කොට්ඨාසයක් වේ. අනෙක් අයගේ සහයෝගය මත තම දිවි පෙවත රැක ගැනීමට වැඩිහිටි අවධියේ කැපී පෙනෙන ලක්ෂණයකි. මේ තත්වය පදනම් කරගෙන වර්ධනය වන වැඩිහිටි ජනගහනය සම්බන්ධව ශ්‍රී ලංකාව තුළ අණ පනත් සහ ප්‍රඥප්ති ආදීය තුළින් වැඩිහිටි අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට සහ ප්‍රවර්ධනයට විධිවිධාන ස්ථාපිත කර තිබේ. එසේම ශ්‍රී ලංකා රජය විසින් ස්ථාපිත කර ඇති යම් යම් විධිවිධාන සහ ඒවායේ ක්‍රියාකාරීත්වයේ ප්‍රමාණාත්මකභාවය සොයා බලා ප්‍රවර්ධනය විය යුතු අංශ හඳුනා ගනිමින් ඒ පිළිබඳ පර්යේෂණාත්මක අදහසක් සමාජගත කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. මෙහිදි තොරතුරු ලබා ගැනීමේදී ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා ආදී ක්‍රම උපයෝගී කර ගන්නා අතර ඒ මත පදනම් වෙමින් ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත රැස් කරන අතර විශ්ලේෂණය සඳහා විස්තරාත්මක ක්‍රමවේදය භාවිතා කරන ලදි. මෙම පර්යේෂණයේ නිගමනය වන්නේ, වයස්ගතවූවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ විවිධ ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගත්ත ද, අද වන විට ඒවා ප්‍රයෝගිකව ක්‍රියාත්මක වීම තුළ ගැටලු පවතින බවයි.

**මුඛ්‍ය පද:** *ජනගහනය, වැඩිහිටි අයිතිවාසිකම්, සංස්කෘතිය*

[7] ශාස්ත්‍රවේදී දේශපාලන විද්‍යා (විශේෂ) තෙවන වසර

## හැඳින්වීම.

පොදුවේ ලෝකයේ සෑම රටක්ම පාහේ මුහුණ දෙන්නා වූ ගැටලුවක් ලෙස ජනගහනය වයෝවෘද්ධ වීම හැඳින්විය හැකිය. ශ්‍රී ලංකාව වයෝවෘද්ධත්වයට පත් වන ජනගහනය සීඝ්‍රයෙන් වැඩිවන රටක් වශයෙන් ඉහළ ස්ථානයක ලා සැලකේ. එසේම 2041 වන විට විට ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය සියයට 24.8 ක් දක්වා වර්ධනය වන බව පෙන්වා දෙන අතර සෑම පුද්ගලයන් හතර දෙනෙක්ගෙන්ම එක් අයකු වැඩිහිටි ජනගහනයට අයත් වන බවත් ය. ප්‍රාග් ඓතිහාසික අවධිය හා නූතන අවධියට පෙර අවධිය තුළ ශ්‍රී ලංකාවේ ජන සමාජය ඉතා නොදියුණු විය. මෙම අවධිය තුළ ශ්‍රී ලංකාවේ පරමායුෂ අපේක්ෂාව අඩු වූ අතර ඒ හරහා විශාල වශයෙන් සිදු වන මරණ සංඛ්‍යාව වැඩි විය. නමුත් නූතන යුගය තුළ ශ්‍රී ලංකාව සිදු වූ විද්‍යාත්මක, තාක්ෂණික හා ආර්ථික ප්‍රබෝධය, බටහිර වෛද්‍ය විද්‍යාවේ දියුණුව, බෝ වන රෝග මැඩ පැවැත්වීමේ ක්‍රම හඳුනා ගෙන වෛද්‍ය ක්‍රම හරහා විධිමත් රාජ්‍ය ප්‍රතිපත්ති මුල් කරගෙන ශ්‍රී ලංකාවේ පරමායුෂ අපේක්ෂාව නිදහසින් පසුව ඉහළ යන්නා ලදී. මේ තත්ත්වය තුළ ක්‍රමයෙන් ශ්‍රී ලංකාව තුළ වැඩිහිටි පරපුරක් නිර්මාණය විය. මේ සමඟම වැඩිහිටි පරපුරේ අභිවෘද්ධිය උදෙසා සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික හා සමාජ සුභසාධන අවශ්‍යතාවය මතු විය. මේ නිසා ලාංකීය රාජ්‍ය ව්‍යූහය තුළ වැඩිහිටි ජනගහනය සම්බන්ධ අණ පනත්, නීති, ප්‍රඥප්ති සහ ජාතික ප්‍රතිපත්ති හරහා මෙන් ම, දේශීය හා විදේශීය සංවිධාන හරහා ද, වැඩිහිටි අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට හා ප්‍රවර්ධනය සඳහා විධිවිධාන යොදා තිබුණ ද, ඒවා ක්‍රියාත්මක වීමේ දී ගැටලු පවතී. වැඩිහිටි අයිතිවාසිකම් ප්‍රවර්ධනය විය යුතු අංශ හඳුනා ගනිමින් වැඩිහිටි අයිතිවාසිකම් ආරක්ෂා කරලීම සඳහා රාජ්‍ය අංශයේ ක්‍රියාකාරීත්වය මෙවන් පසුබිමක් තුළ සැබවින්ම වැදගත්ය.

### වැඩිහිටි පුරවැසියා යනු කවරෙක්දැයි හඳුනා ගැනීම.

වයස්ගත වීම ජීව විද්‍යාත්මක ක්‍රියාදාමයකි. එය සෑම ජීවියකුට ම අනිවාර්යවූත් සාධාරණවූත් සංසිද්ධියක් වෙයි. මහලු අය කෙරෙහි දක්වන සමාජීය ආකල්පය යුගයෙන් යුගයට සමාජයෙන් සමාජයට මෙන් ම සංස්කෘතියෙන් සංස්කෘතියට ද, වෙනස් ය. උදාහරණ ලෙස ගතහොත් ඇස්කිමෝවරු, බුෂමන්වරු, පුරාන චීන වැසියන් මහලු අය නොවැදගත් පිරිසක් ලෙස හඳුන්වනු ලැබේ. නමුත් තවමත් ප්‍රාථමික තත්වයේ පසුවන රතු ඉන්දියානුවන්, අශාන්තිවරු සහ ඕස්ට්‍රේලියාවේ නිසරු ඉඩම්වල වැසියන් මෙන්ම වර්තමානයේ දියුණු හා දියුණු වෙමින් පවතින රටවල් වයස්ගත පුද්ගලයින් ඉතා අගය කරනු ලැබේ. ලෝක වැඩිහිටි වර්ෂය වෙනුවෙන් 1981දී පැවැති සම්මේලනයේ දී ගෙන ඇති තීරණය අනුව යමෙකු හැටට (60) එළැඹීමේ අවස්ථාව වැඩිහිටියෙකු බවට පත්වීමේ සීමාව වශයෙන් පිළිගෙන ඇත (සම්භාෂා, 2000: 780). පෙමේටන්ස් සිය Old and None කෘතියේ දක්වන පරිදි මහලු මිනිසුන් ලෙස නිර්වචනය කරන්නේ අවුරුදු 65 සහ ඊට වැඩි අය ලෙසිනි. (අමරසේකර, 2005: 98). එසේම, සංවර්ධනය වෙමින් පවතින රටවල කෙරෙහි අවධානය යොමු කිරීමේ දී එම රටවල් වියපත් වූවන් ලෙස අර්ථ දක්වන්නේ වයස අවුරුදු 60ක් හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාව වුව ද සංවර්ධිත රටවල එම කණ්ඩායම යටතට ගැනෙන්නේ අවුරුදු 65 හෝ ඊට වැඩි වයස් කාණ්ඩවල පුද්ගලයන්ය (සිල්වා, 2004: 90). කෙසේවෙතත්, එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව 1995 වසරේ ආසියාවේ ජීවත් වූ වයස අවුරුදු 60 හෝ ඊට වැඩි ජන සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 82ක් වූ අතර මෙය වසර 2000 දී සියයට 86ක් වූ අතර වසර 2020 වන විට 12.6%ක වර්ධනයක් වනු ඇතැයි ප්‍රක්ෂේපිත දත්ත පෙන්නුම් කරයි (සිල්වා, 2004: 96).

පොදුවේ ගත් කළවැඩිහිටියා යනු, ජාතික කෞතුක සම්පතකි. දිගු කාලීන සමාජීය අත්දැකීම්වලින් පෝෂණය වූ වැඩිහිටියා සමාජ සංවර්ධනයේ දී අත්‍යවශ්‍ය සාධකයකි. එමෙන්ම වැඩිහිටියන් දේශපාලනය තුළ මෙන්ම ආගම හා සංස්කෘතිය තුළ ද, වැදගත් සාධකයක් ලෙසට හැඳින්විය හැක. වැඩිහිටි පුද්ගලයා ජීවන චක්‍රයේ බොහෝ අවධීන් පසු කරමින් විවිධ යුතුකම් ඉටු කරමින් සමාජීය වශයෙන් වැදගත් කාර්යයක් ඉටු කරනු ලබයි.. කෙසේවෙතත්, මානව සම්පත් විකාශනයේ දී මුල් කාලීනව සමූහයක්, කණ්ඩායමක් වශයෙන් ජීවත් වීමේ දී එම සමූහය තුළ විටෙක නායකත්වය ශක්තිවන්තයාට හිමි වූ අතර තවත් විටෙක නායකත්වය 'වැඩිහිටියා' ට ද, හිමි විය. උදාහරණ ලෙස තිත්තිර ජාතකය ආදී බෞද්ධ සාහිත්‍යය තුළින් ද, මෙය විද්‍යාමාන වේ. ඒ අනුව වැඩිහිටියා ජීව

විද්‍යාත්මකව ගත් කළ වැඩි කාලයක් ජීවත් වූත් සමාජ විද්‍යාත්මකව ගත් කළ සමාජ අත්දැකීම් බහුලවූත් අයෙකි (අමරසේකර, 2005: 96).

## ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනයේ වර්ධනීය අවස්ථාවන්

දිගු කාලීන සමාජීය අත්දැකීම් වලින් පෝෂණය වූ වැඩිහිටියා සමාජ සංවර්ධනයේ දී අත්‍යවශ්‍ය සාධකයකි. වැඩිහිටියා සිය වයස පිරීමත් සමඟ නිල වශයෙන් විශ්‍රාම ගිය ද ඔහු/ඇය සිය සේවය සියලු සමාජ සංස්ථාවන්හි සංවර්ධනය සඳහා ලබා දෙයි. ශ්‍රී ලංකාවේ ජනගහනය ගත් විට ඉතාම වැදගත් හා නිතර යොදා ගන්නා ප්‍රධාන වයස් සමූහ තුනක් ඇති බව පෙන්වයි. එනම්, අවුරුදු 15ට අඩු ළමා විය, අවුරුදු 15-55 ශ්‍රම බලකාය හා අවුරුදු 60 හෝ ඊට වැඩි පිරිස වයස්ගත ජනගහනය ලෙස හැඳින්වේ (ජන හා නිවාස සංගණනය, 2011: 02). ශ්‍රී ලංකාවේ මේ වන විට වයස්ගත ජනගහන මට්ටම ඉහළ යාමත් ඔවුන් සංවර්ධන ක්‍රියාවලිය තුළ නොසලකා හැරීමත් අනාගතයේ රටට දැරිය නොහැකි බව සංවර්ධන විශේෂඥයින් සඳහන් කරයි. ශ්‍රී ලංකාවේ 1981-2012 සංගණනය කාල පරිච්ඡේදය තුළ වයස අවුරුදු 15ට අඩු ජනගහනය සියයට 35.2 සිට සියයට 25.8 දක්වා ප්‍රතිශත ඒකක 9.4 කින් අඩු වී ඇත (ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2012: 67). ඒ පිළිබඳ දත්ත පහත වගුවෙන් දක්වා ඇත.

වගු අංක 01: වයස් කාණ්ඩය අනුව වියපත් ජනගහනය සහ පුම්තිරි අනුපාතය 1981-2012

| වර්ෂය | වයස අවු: 60 සිට 74 දක්වා ජනගහණය | | | වයස අවු: 75 ට වැඩි ජනගහණය | | |
|---|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | පුම්තිරි අනුපාතය | පුරුෂ | ස්ත්‍රී | පුම්තිරි අනුපාතය |
| 1981 | 413,800 | 359,547 | 115.1 | 108,600 | 99,861 | 108.8 |
| 2012 | 891,038 | 1,072,575 | 83.1 | 224,613 | 332,347 | 67.6 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2012.

මෙම කාලය තුළ වයස අවුරුදු 15 ට අඩු ජනගහනය අඩු වෙද්දී වයස අවුරුදු 60 හා ඊට වැඩි ජනගහනය සියයට 6.6 සිට සියයට 12.2 දක්වා ප්‍රතිශත ඒකක 5.6 කින් වැඩි ඇත. ශ්‍රී ලංකාව තුළ නිදහස් සෞඛ්‍යය සේවයේ ව්‍යාප්තිය විස්තෘත පවුල න්‍යෂ්ටික පවුල දක්වා පරිවර්තනය වීම වැනි සාධක වයස් ගත ජන අනුපාතය ඉහළ යාමට බලපා ඇත. මේ හේතු කොට ගෙන වියපත් ජනගහනය වර්ධනයත් සමඟ ශ්‍රී ලංකාවේ යැපුම් අනුපාතය වර්ධනය විය. ඒ පිළිබඳව පහත දක්වා ඇති 2 වගුවෙන් වඩාත් හොඳින් ගම්‍ය වේ.


වගු අංක 02: 1991 සිට 2041 දක්වා යැපුම් අනුපාතය සම්මත ප්‍රක්ෂේපණය

| වර්ෂය | ළමා යැපුම් වයස අවුරුදු 15 | මහළු වයස් යැපුම් වයස අවුරුදු 60 | මුළු යැපුම් |
|---|---|---|---|
| 1991 | 51.9 | 13.5 | 65.4 |
| 1996 | 44.0 | 14.3 | 58.3 |
| 2001 | 38.0 | 15.3 | 53.3 |
| 2006 | 35.4 | 17.2 | 52.6 |
| 2011 | 33.9 | 20.1 | 54.0 |
| 2016 | 32.1 | 24.0 | 56.1 |
| 2021 | 29.8 | 28.2 | 58.0 |
| 2026 | 27.0 | 32.1 | 59.1 |
| 2031 | 24.6 | 36.0 | 60.6 |
| 2036 | 24.1 | 41.1 | 65.2 |
| 2041 | 24.6 | 47.9 | 72.5 |

මූලාශ්‍රයː ද සිල්වා, 1997.

මෙසේ වැඩිහිටි ජනගහනය වර්ධනය විම හේතු කොට වසර 2020 වන විට මෙරට ජනගහනයෙන් සියයට 56ක් වයස අවුරුදු 60 ඉක්ම වූ වයෝවෘද්ධ පුද්ගලයන්ගෙන් සමන්විත වන බව "හෙල්ප් ඒජ්" ආයතනය සඳහන් කරයි. ඔවුන් තව දුරටත් පවසනුයේ මෙයට හේතු වී ඇත්තේ මේ වන විට ලාංකීකයන්ගේ ජීවිත අපේක්ෂා ආයු කාලය අවුරුදු 74ක් වීම සහ මරණ සංඛ්‍යාව 1000කට 6ක් වීමත් උපත් සංඛ්‍යාව සියයට 1 ක් වීමත් බවය. මෙම තත්වය යටතේ 21 වන සියවස" වයෝවෘද්ධයන්ගේ සියවස" යනුවෙන් හැඳින්වීමට පුළුවන් බවට සැකයක් නැතැයි ශ්‍රී ලංකා හෙල්ප් ඒජ් ආයතනයේ අධ්‍යක්ෂ ජේ. ඩබ්ලිව්. විජේවන්ත මහතා ප්‍රකාශ කර ඇති අතර වැඩිවන වැඩිහිටි පරපුර නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගත හැකි හැකි ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමට රජය වහා පියවර ගත යුතු බව ඔහු පවසයි (ලංකදීප, 2001, 08). ශ්‍රී ලංකාවේ වියපත් වීමේ දර්ශකය පහත ප්‍රස්තාර 01න් දක්වා ඇත.

ප්‍රස්ථාර අංක 01ː ශ්‍රී ලංකාව වියපත් වීමේ දර්ශකය




මූලාශ්‍රයː ජන හා නිවාස සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2012.


2012 දී වර්ෂයේ දී කරන ලද සංගණන තොරතුරු වලට අනුව වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයන්ගෙන් සියයට 25.6 ක්ම ආර්ථිකයට දායකත්වය ලබා දෙන අතර ඔවුන්ගෙන් අඩක්ම තමන්ගේ ආර්ථික කටයුතු වල නියැලෙන්නන් වීම සැලකිය යුතු කරුණකි. වෙළෙන්දන්, කෘෂි කාර්මික කටයුතුවල නියැලෙන්නන් වැනි තමන්ගේ ආර්ථික ව්‍යාපාර පවත්වාගෙන යන අය මෙම කාණ්ඩයට අයත් වේ.

## වැඩිහිටි අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ රාජ්‍ය විධිවිධාන හා එහි ක්‍රියාකාරීත්වය.

ශ්‍රී ලංකාව තුළ වයස්ගත ජනගහනය සම්බන්ධයෙන් කාලයක් මුළුල්ලේ ප්‍රතිපත්ති නිර්මාණය වී තිබේ. වර්ෂ 1939 අංක 30 දරණ "දිළිඳු සහන ආඥා පනත"වූ කලී වැඩිහිටියන් වෙනුවෙන් නිකුත් වූ පළමුවන නෛතික ප්‍රතිපත්තියයි. එමෙන්ම 'ජන සවිය 'වැඩසටහන ද, 2000 අංක 09 දරන පාර්ලිමේන්තු පනත සම්මත කිරීම තුළින් ස්ථාපනය කළ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව, ජාතික වැඩිහිටි මහා ලේකම් කාර්යාලය, වැඩිහිටියන් පිළිබඳ නඩත්තු මණ්ඩලය, ග්‍රාමීය මට්ටමේ වැඩිහිටි සංවිධාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආදී ආයතන වැඩිහිටියන් සඳහා සමාජ ආරක්ෂණයක් පිහිටු විය. තවද ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම්පත මගින් ද, වැඩිහිටියන්ට රාජ්‍ය වරප්‍රසාද හිමි වී තිබේ.

කෙසේවෙතත් අද වන විට ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් 2000 අංක 09 දරණ පනත මගින් ස්ථාපිත කළ ආයතනයක් ලෙස වැඩිහිටි මහා ලේකම් කාර්යාලය හැඳින්විය හැක. මෙම ආයතනය ක්‍රියාත්මක කරනු ලබන්නේ සමාජ සේවා අමාත්‍යාංශය යටතේය. මෙම ආයතනය හරහා වැඩිහිටි අයිතිවාසිකම් වෙනුවෙන් විශාල සේවයක් සිදු වේ. මෙවර මෙහි තේමාව වූයේ "වැඩිහිටි අයිතිවාසිකම් සුරක්ෂිත හෙටක් " යන්නයි. ශ්‍රී ලංකාවේ සෑම ග්‍රාම නිලධාරී වසක්ම ආවරණය වන පරිදි වැඩිහිටි සමිති පිහිටු වීම ආයතනයේ ප්‍රධානතම අරමුණ වේ. ඒ අනුව, දැනට ග්‍රාමීය වැඩිහිටි සමිති 11512ක් ද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩල 256ක් ද, දිස්ත්‍රික්ක වැඩිහිටි බල මණ්ඩල 25ක් ද, පළාත් වැඩිහිටි බල මණ්ඩල 8ක් ද, මේ වන විට පිහිටුවා තිබේ. 2015 වර්ෂයේදී උක්ත ආයතනික සේවා සඳහා රුපියල් මිලියන 6ක් වෙන් කර ඇත. ඒ අනුව, ග්‍රාමීය වැඩිහිටි සමිතියක් සඳහා රුපියල් 5000 ක් ද, ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩලයක් සඳහා 7500ක් ද, දිස්ත්‍රික් වැඩිහිටි බල මණ්ඩලයක් සඳහා රුපියල් 15000ක් ද, පළාත් වැඩිහිටි බල මණ්ඩලයක් සඳහා රුපියල් 2500ක් ද බැගින් ආධාර ලබා දෙනු ලැබේ (වැඩිහිටියෝ, 2016: 107). ශ්‍රී ලංකාවේ වැඩිහිටි බල මණ්ඩල ක්‍රියාත්මක වන අයුරු. රූප සටහන 01න් දැක්වේ.

රූප සටහන 01: ශ්‍රී ලංකාවේ වැඩිහිටි බල මණ්ඩල ක්‍රියාත්මක වන අයුරු.




මූලාශ්‍රය: වැඩිහිටි වාර්ෂික සාර සංග්‍රහය, 2014

එසේම, ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය මඟින් වැඩිහිටි සේවා සත්කාරක ක්‍රමයක් ස්ථාපනය කර ඇත. ඒ මඟින් වියපත් වැඩිහිටියන් රැක බලා ගැනීම සඳහා විශ්වාසවන්ත පුහුණු වැඩිහිටි සත්කාරක සේවා සපයන්නකුගේ සේවය ලබා ගත හැකිය. දිවා කාලයේ පැය 8ක සේවා මුරයක් සඳහා රුපියල් 750ක මුදලක් ද, රාත්‍රි කාලයේ පැය 8ක සේවා මුරයක් සඳහා රුපියල් 900ක් ද, වැඩිවන සෑම පැයක් සඳහාම රුපියල් 100ක් ද, දිනකට රුපියල් 1650ක් ද, වේ (වැඩිහිටියෝ, 2016: 108). තව ද, 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මගින් ස්ථාපිත කළ නඩත්තු මණ්ඩල ද මෙම කාර්යාලය යටතේ ක්‍රියාත්මක වේ. වයස්ගත වූවන්ගේ ජීවිතයේ අවසාන අවධිය සතුටින් ගත කර මිය යන්නේ ඉතා සීමිත කොටසකි. ඔවුන්ගේ දෑතේ සවිය හීන වී ගොස් ඇත්තේ දරුවන් උදෙසා වෙහෙස මහන්සි වී ඔවුන් පෝෂණය කිරීම නිසාය. එහෙත් දරුවන් වැඩිවිය පත් වූ පසු දෙමාපියන් අමතක කරන යුගයක් බිහි වී තිබෙන හෙයින් මේ සඳහා රජය විසින් ගත් මහඟු ක්‍රියා මාර්ගයක් ලෙස නඩත්තු මණ්ඩල වැඩසටහන හැඳින්විය හැකිය. (වැඩිහිටියෝ, 2016: 107).

වැඩිහිටි සුභසාධනය අරමුණු කරගනිමින් ක්‍රියාත්මක වන තවත් වැඩසටහනක් ලෙස වැඩිහිටි ආවරණ කැපකරු අනුග්‍රාහකත්ව යෝජනා ක්‍රමය දැක්විය හැකිය. වැඩිහිටි ආවරණ කැපකරු අනුග්‍රාහකත්ව යෝජනා ක්‍රමය යටතේ කිසිඳු හවුහරණක් නොමැති වයස 70ට වැඩි වැඩිහිටියන් හට අනුග්‍රාහකයෙකු වෙතින් මසකට රුපියල් 500ක් ලබා ගත හැකිය. මෙහිදී අනුග්‍රාහකත්වය දැක්විය හැකි පුද්ගලයන් හට නුගේගොඩ ලංකා බැංකුවේ, 5234881 ශාඛාවට මුදල් බැර කළ හැකිය. මෙම අනුග්‍රාහකත්වය,වසට 1කට රුපියල් 3,000 බැගින් ද, වසර 2කට රුපියල් 6000 බැගින් ද, වසර 3කට රුපියල් 8500 බැගින් ද, වසර 4කට 11,000 බැගින් ද වේ. වැඩිහිටි ආවරණ කැපකරු ව්‍යාපෘතියේ අරමුණු ලෙස අසරණභාවයට පත් වූ වැඩිහිටියන්ගේ දෛනික අවශ්‍යතා හැකිතාක් දුරට ඉටු කිරිම සහතික කිරීම, අසරණ භාවයට පත් වූ වැඩිහිටියන් ශාරීරිකව හා මානසිකව සංවර්ධනය කිරීම, පවුල තුළම ජීවත් වීමෙන් අවසාන භාගය සතුටින් ගත කිරීමේ අවස්ථාව ලබා දීම දැක්විය හැකිය. තවද, වැඩිහිටිවිය සමග වැළඳෙන අක්ෂි ආබාධ ශල්‍යකර්මයකින් සුව කර ගැනීමට අවශ්‍ය අක්ෂි කාච වයස අවුරුදු 60ට වැඩි රුපියල් 3,000ට අඩු මාසික ආදායමක් ලබන වැඩිහිටියන්ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නොමිලේ ලබා ගන්නට හැකිය. එසේම රෝහල, තැපැල් හල, ඔසුසල, බැංකුව ආදී රාජ්‍ය ආයතනවල දී හා වෙනත් ආයතනවල දී වැඩිහිටියන්ට ප්‍රමුඛතාව ලබා දීමට වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීමේ සේවාවක් මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක වේ. (වැඩිහිටි වාර්ෂික සාර සංග්‍රහය, 2014: 109).

වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීමේ භාරදූර කාර්ය සමාජගත කිරීම සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව 2000 අංක 09 දරන පනත යටතේ ස්ථාපනය කර ඇත. ජාතික වැඩිහිටි සභාවේ ප්‍රධාන කර්තව්‍යය වන්නේ ශ්‍රී ලංකාවේ සිටින වැඩිහිටි තැනැත්තන්ගේ සුබ සාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ වැඩිහිටි තැනැත්තන්ට ආත්ම ගෞරයක්, ස්වාධීනත්වයක් හා ගරුත්වයක් ඇතිව ජීවත් වීමට අවස්ථාවක් සලසා දීම හා පරිසරය ගොඩනගා දීමය. මෙම සභාවේ අනෙකුත් කර්තව්‍යයන් ලෙස වැඩිහිටි තැනැත්තන්ගේ සුභ සාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ රජය උපදෙස් දීම, ශ්‍රී ලංකාවේ පාරම්පරික සාරධර්ම මත පදනම් වූ පවුල් ඒකකය ශක්තිමත් කිරීම සඳහා රජයට හා අනෙකුත් සුදුසු ආයතනවලට වැඩසටහන් නිර්දේශ කිරීම, වැඩිහිටි තැනැත්තන්ගේ සුභ සාධනය, අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ආගමික ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශයේ සංවිධාන, ප්‍රජා මූලික සංවිධාන සඳහා අවශ්‍යය සියලු පියවර ගැනීම, වැඩිහිටි තැනැත්තන් කෙරෙහි ළමා හා තරුණ පරපුරෙන් ඉටු විය යුතු යුතුකම් ඔවුනට මනාව අවබෝධ කර දීමේ අදහසින් පෙර පාසල්, දහම් පාසල් හා උසස් අධ්‍යාපන ආයතනවල වැඩමුළු සංවිධානය කිරීම යන ඒවා හැඳින්විය හැකිය (වැඩිහිටි කමිටු සඳහා වූ අත් පොත, 2013: 2).

එමෙන් ම, බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල මෙන්ම ශ්‍රී ලංකාව තුළ ද වැඩිහිටි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා කාලයකට ඉහත දී හඳුන්වා දුන් ප්‍රතිපත්තියක් ලෙස "විශ්‍රාම වැටුප්" ක්‍රමය හැඳින්විය හැක. කෙසේ නමුදු මේ කෙරෙහි බලපාන ලද පදනම සකස් වූයේ 1944

ජූනි මස දී පැවැත් වූ ශ්‍රීමත් අයිවෝ ජෙනිස් මහතාගේ සහාභාගීත්වයෙන් සමාජ සේවා කොමිසම හරහාය. කෙසේ වෙතත් වයස්ගත වීමෙන් පසු ලැබෙන විශ්‍රාම වැටුප් ක්‍රම මගින් රජයේ සහ පෞද්ගලික ආයතන වල රැකියාවන්හී නියුක්ත වී සිටි වැඩිහිටියන් පිළිබඳ සලකා බලනු ලබන අතර මේ සම්බන්ධව රජයේ නීතිමය පැනවීම් බොහෝමයක් දක්නට ලැබේ. මේ සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂාව, වැන්දඹු සහ අනත් දරු පනත, පාසල් ගුරු භවතුන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමය, 1958 කම්කරු වන්දි ආඥා පනත, අර්ථ සාධක අරමුදල, සේවා ගිවිසුම් ආඥා පනත, පාරිතෝෂික ආඥා පනත හා සේවක භාරකාර අරමුදල් පනත පිළිබඳ වාර්තා වලට විශ්‍රාම ගිය සේවකයන් ද අදාළ වේ. එමෙන්ම 1987 ගොවීන්ගේ විශ්‍රාම හා සමාජ ආරක්ෂක ප්‍රතිලාභ පිළිබඳ අංක 12 පනත මඟින් වයස්ගත ස්වයං රැකියාවෙහි නිරත වූ ගොවීන්ගේ සුභසාධනය සපයනු ඇත (වැඩිහිටියෝ, 2014: 55).

එසේම, 1948 ජූනි මස 12 වන දින ප්‍රකාශය මගින් 1947 ආඥා පනත් අංක 02 හි 2 වන වගන්තියට යටතේ 1901 සිට ශ්‍රී ලංකාවේ ලිඛිත නීතියෙහි විශ්‍රාම වැටුප් හා සම්බන්ධ අංශ කෙරෙහි වූ වාර්තා සකස් කෙරේ. මෙම විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවේ ස්ථිර සේවයකයන් දරන සියලුම රජයේ සේවකයන් විශ්‍රාම වැටුප් සහිත යැයි ප්‍රකාශ ඇත. එනම් ඔහු රජයට අවම වශයෙන් මාස 120 ක් සේවය කර ඇත්නම් ඔහු විශ්‍රාම යාමත් සමග විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබේ. එමෙන්ම වැන්දඹු සහ අනත්දරු පනතෙහි පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ මරණයට පත් රජයේ සේවකයන්ගේ වැන්දඹුවන්ට සහ අනාථ දරුවන්ට විශ්‍රාම වැටුපක් දීමය. 1983 වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනතට අනුව රාජ්‍ය සේවයේ නියුතු වූ ස්ත්‍රීන්ගේ වැන්දඹු පුරුෂයන් සහ අනාථ දරුවන්ට විශ්‍රාම වැටුප් දෙනු ලැබේ. මෙම ක්‍රමය අනාථ දරුවන්ට දෙනු ලබන විශ්‍රාම වැටුප පිරිමින් සඳහා අවුරුදු 18 දක්වාත් ස්ත්‍රීන් සඳහා විවාහ වීම දක්වා හෝ අවුරුදු 21 දක්වාත් පමණක් ගෙවනු ලැබේ (වැඩිහිටියෝ, 2014: 56). රජයේ සේවකයන්ගේ පෞද්ගලික වැටුප් හා විශ්‍රාම වැටුප් ගෙවීම් පහත 03 වගුවෙන් දක්වා ඇත.

වගු අංක 03: රජයේ සේවකයන්ගේ පෞද්ගලික වැටුප් හා විශ්‍රාම වැටුප් ගෙවීම (1996-2000)

| කරුණ | 1996 | 1997 | 1998 | 1999 | 2000 |
|---|---|---|---|---|---|
| 1. පෞද්ගලික වැටුප් | 2624.82 | 31264.28 | 40046.20 | 40799.20 | 49578.00 |
| 2.විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමකයින් සංඛ්‍යාව | 332824.00 | 342343.00 | 364472.00 | 364472.00 | 371722.00 |
| 3. මුළු විශ්‍රාම වැටුප් ගෙවීම | 14442.67 | 18268.99 | 19427.92 | 19427.92 | 21952.33 |
| 4. විශ්‍රාම වැටුප් ගෙවීම පෞද්ගලික වැටුප් වලින් ප්‍රතිශතයක් | 55.02 | 58.43 | 48.51 | 48.51 | 44.28 |

Source: State Accounts/ Reported Department of Government Pensions, 1996- 2000

මෙයට අමතරව ජාතික ආර්ථිකයට ඵලදායී මෙහෙවරක් ඉටු කරන රාජ්‍ය විශ්‍රාම වැටුපකින් ආවරණය නොවන සියළුම නියුක්තිකයන්ගේ වියපත් දිවිය යම් පමණකට සුරක්ෂිත කිරීම සඳහා විශ්‍රාම වැටුප් සැලසුම් ක්‍රියාවට නංවා ඇත. එම කාර්ය භාරය ඉටු කිරීම සඳහා 1996 අංක 17 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපිත රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ක්‍රියාත්මක වේ. අවිධිමත් අංශයේ රැකියාවල නිරතවන සංඛ්‍යාව දිනෙන් දින වැඩි වේ. මොවුන්ගේ වියපත් දිවියට සුරක්ෂිත රැකවරණය සඳහා ක්‍රියාත්මක සමාජ ආරක්ෂණ වැඩසටහන් අතරින් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ක්‍රියාවට නංවා ඇති විශ්‍රාම වැටුප් ක්‍රමවේදය ප්‍රමුඛත්වය ගනී. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල තේමාව වන්නේ, "අභිමානවත් ජාතියක් ගොඩනැගීම උදෙසා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා නියාමනය තුළින් යහපාලන ප්‍රතිපත්තිවලට අනුගමනය වෙමින් ශ්‍රී ලාංකීක පුරවැසියන්ගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික සුරක්ෂිතභාවය වෙනුවෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනය සමඟ උපාය මාර්ගික සම්බන්ධතා ගොඩනගමින් තිරසර සංවර්ධනයක් කරා" යන්නයි. ඒ අනුව විවිධ ක්ෂේත්‍රවල 5200 කට ආසන්න

ප්‍රමාණයක් සඳහා යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබා දී ඇත. සාමාජිකයන් 24000 කට ආසන්න සංඛ්‍යාවක් බැංකු ජාලය හරහා මාසික විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිකම් ලබයි. එමෙන්ම පූර්ණ හා අර්ධ අබලතා ප්‍රතිලාභ යටතේ ද, සැළකිය යුතු සංඛ්‍යාවක් අදාළ හිමිකම් ලබා ඇත (වැඩිහිටියෝ, 2014: 35).

## නිගමනය

සෑම රටකම වැඩිහිටියන්ගේ සමාජ, ආර්ථික, සංස්කෘතික, දේශපාලනික අයිතිවාසිකම් රැක දීම රාජ්‍යයක් සතු වගකීමකි.. ශ්‍රී ලංකාව තුළ වැඩිහිටි අයිතිවාසිකම් සම්බන්ධයෙන් රාජ්‍ය අංශය තුළින් විවිධ ප්‍රතිපාදන ක්‍රියාත්මකවනු දක්නට ලැබේ. එමෙන්ම වැඩිහිටි මහා ලේකම් කාර්යාලය, වැඩිහිටි කමිටු, ජාතික සභාව ආදී යාන්ත්‍රණ තුළින් වැඩිහිටි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගෙන තිබෙන පියවරයන් ලෙස දැකිය හැක. රාජ්‍ය අංශය සමගින් මේ සඳහා රාජ්‍ය නොවන ස්වේච්ඡා සංවිධාන වන හෙල්ප් ඒජ් වැනි ආයතන ද, එක් වී තිබේ. නමුත් මෙම සේවාවන් බිම් මට්ටමෙන් සැපයීමේ දී යම් යම් දුර්වලතා පවතී. එනම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් මෙම වැඩිහිටි සේවාවන් ඉටු කිරීමේ දී යම් යම් දුර්වලතා දක්නට ලැබේ. මන්ද ඇතැම් අවස්ථාවල රජයේ රැකවරණය ලැබිය යුතු වැඩිහිටියන් බොහෝ දෙනෙකුට එම අයිතිවාසිකම් ප්‍රායෝගික සමාජයේදී හිමි නොවන තත්ත්වයක් දක්නට ලැබේ. කෙසේවෙතත්, වැඩිහිටි විය යනු එක්තරා අවධියක් ලෙස අර්ථ දැක්විය හැක. මේ අනුව එම අවධිය ද ජීවිතයේ ගත කළ අනෙක් අවධීන් මෙන්ම සතුටින් ගත කිරීම මොවුන්ගේ අභිප්‍රායයි. එම අභිප්‍රාය ඉටු කරලීම රජය සතු වූ වගකීමකි.

## ආශ්‍රිත ග්‍රන්ථ


අබේවික්‍රම., 2011. *මහින්ද චින්තන ජනතා ඇසින්*, කතෘ ප්‍රකාශයකි.

අමරසේකර, ඩී., 2016. *වියපත්භාවය පිළිබඳ සමාජ විද්‍යාව*, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

අමරසේකර, ඩී., 2005. *ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රශ්න*, වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.

ද, සිල්වා, අයි., 2004. *ජනගහන අධ්‍යයනය ශ්‍රී ලංකාව ඇසුරින්*, කතෘ ප්‍රකාශනයකි.

මතිලාල්, කේ., 2009. *ලෝක ළමා දිනය හා වැඩිහිටි රැකවරනයේ ගැටලුවක්*, දිවයින, 2009 නොවැම්බර් 7

චිත්‍රාංගනී යමුනා, ඩබ්ලිව්., 2013. *ග්‍රාමීය වැඩිහිටි කමිටු සඳහා වූ අත් පොත*, තලංගම: නලීන් ඇඩ්ස්

ජාතික වැඩිහිටි මහා ලේකම් කාර්යාලය. 2010, *වැඩිහිටියෝ*, බත්තරමුල්ල:සමාජ සේවා හා සමාජ සුභ සාධන අමාත්‍යාංශය

ජාතික වැඩිහිටි මහා ලේකම් කාර්යාලය. 2014, *වැඩිහිටියෝ*, බත්තරමුල්ල: සමාජ සේවා හා සමාජ සුභ සාධන අමාත්‍යාංශය

ජාතික වැඩිහිටි මහා ලේකම් කාර්යාලය. 2016, *වැඩිහිටියෝ*, බත්තරමුල්ල: සමාජ සේවා හා සමාජ සුභ සාධන අමාත්‍යාංශය

ජාතික වැඩිහිටි මහා ලේකම් කාර්යාලය. 2001, *වැඩිහිටියෝ*, බත්තරමුල්ල: සමාජ සේවා හා සමාජ සුභ සාධන අමාත්‍යාංශය

ජන සංගණන හා ප්‍රජා විද්‍යා අංශය, 2014. *ශ්‍රී ලංකාවේ ඉහළ යන වැඩිහිටි ජනගහනය*, කොළඹ: ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජයකොඩි,එස්,කේ., 2008. *ශ්‍රී ලංකා තිරසාර සංවර්ධනය, අභියෝග හා ප්‍රතිචාර*, කතෘ ප්‍රකාශනයකි.

දේශපාලන විද්‍යා සංගමය., 2015. *රාජ්‍ය ප්‍රතිපත්ති පර්යේෂණ ලිපි සමුච්චය,* කැලණියඃ කැලණිය විශ්ව විද්‍යාලය

සමාජ සේවා හා සුභ සාධක අමාත්‍යංශය, 2006. *ශ්‍රී ලංකා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය,* බත්තරමුල්ලඃ සමාජ සේවා හා සමාජ සුභ සාධන අමාත්‍යාංශය

2000 අංක 09 දරන වැඩිහිටි අයිතිවාසිකම් සඳහා වූ පනත, 2000. කොළඹ; රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

2011 අංක 05 දරන වැඩිහිටි අයිතිවාසිකම් සඳහා වූ (සංශෝධිත) පනත, 2011. කොළඹ; රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

www.socialwelfare.gov.lk

www.statistics.gov.lk